# ලංසු සඳහා ආරාධනයි

## රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

## අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි යෝජිත තෙමහල් ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම - අදියර - VI

01. අම්පාර දිස්ත්‍රික් ලේකම් වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි යෝජිත තෙමහල් ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම සහ විශේෂිත ස්ථාපනය කිරීම, අදියර - VI සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය මගින් ලංසුකරණය මෙහෙයවේ.

03 ව්‍යාපෘති දළ විශ්ලේෂණය සහ විෂය පථය

04. මෙම කාර්යය පහළ බිම් මහල, බිම් මහල සහ ඉහළ මහල් දෙකකින් සමන්විත, දළ බිම් ප්‍රමාණය වර්ග මීටර් 2944 ක් පමණ වන තෙමහල් ගොඩනැගිලි සංකීර්ණයේ ඉතිරිව ඇති වැඩ නිම කිරීමේ කටයුතු වලින් සමන්විත වේ. පලමු මහල, දෙවන මහල සහ වහලය මේ වන විටත් සම්පූර්ණ කර ඇත. පහත වගුවෙහි ලැයිස්තුගත කර ඇති කාර්යයන් ඉටු කිරීම මෙම කොන්ත්‍රාත්තුවට අයත් වේ.

05. ප්‍රධාන කොන්ත්‍රාත්කරු C4 හෝ ඉහළ ශ්‍රේණියේ කොන්ත්‍රාත්කරුවකු විය යුතු අතර, සම්පූර්ණ විෂය පථය සඳහා වගකිව යුතු වේ. එමෙන්ම සියලුම විශේෂිත යාන්ත්‍රික සහ විදුලි (EM) වැඩ කටයුතු, BOQ හි සඳහන් කර ඇති EM ශ්‍රේණිගත කිරීම්වලට අනුකූල සුදුසුකම්ලත් උප කොන්ත්‍රාත්කරුවන් මගින් සිදුකරන බවට සහතික විය යුතුය.

| කර්මාන්ත කාණ්ඩය | ඇස්තමේන්තුගත පිරිවැය (VAT රහිත) රු. |
|---|---|
| ඉතිරි සිවිල් කර්මාන්ත | 24,272,000.00 |
| වායු සමීකරණය (VRF/ VRV සහ Split) | 30,011,000.00 |
| විදුලි සෝපානය (Machine Room - Less Lift) | 10,340,000.00 |
| අකුණු සන්නායක පද්ධතිය | 4,808,000.00 |
| ගිනි අනතුරු ඇඟවීමේ සහ හඳුනා ගැනීමේ පද්ධතිය | 2,426,000.00 |
| **එකතුව** | **71,857,000.00** |

06. ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමේ කාලය දින 210කි.

07. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවූවෙක් විය යුතු අතර, පහත අවශ්‍යතාවයන් සපුරා තිබිය යුතුය.
    - i. ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ C4 හෝ ඉහළ ශ්‍රේණියක් සඳහා CIDA ලියාපදිංචිය.
    - ii. පසුගිය වසර පහ තුළ ඉටුකරන ලද ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්තයන්ගේ සාමාන්‍ය වාර්ෂික ධාරිතාව අවම වශයෙන් රුපියල් මිලියන 180ක් විය යුතුය.
    - iii. පසුගිය වසර පහ තුළ සමාන ස්වභාවයේ හා සමාන සංකීර්ණත්වයෙන් යුත් එක් ව්‍යාපෘතියක් සම්පූර්ණකොට තිබිය යුතුය.
    - iv. මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 30ක් හෝ ඊට වැඩි ණය පහසුකමක් ලබාගැනීම සම්බන්ධයෙන් ලංසුකරුගේ නිල බැංකු ප්‍රකාශනය

08. මේ පිළිබඳව උනන්දුවක් දක්වන සියලුම පාර්ශව, ප්‍රසම්පාදන ලිපි ලේඛන ලබාගැනීමට පෙර 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

09. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, ප්‍රධාන ගණකාධිකාරී වෙතින් ලබාගත හැකි අතර, 2026.02.03 දින සිට 2026.02.24 දින දක්වා වැඩකරන දිනයන්හිදී 9.00 පැය සිට 15.00 පැය දක්වා කාලයේදී පහත දැක්වෙන ලිපිනයේදී ප්‍රසම්පාදන ලිපි ලේඛන පරීක්ෂා කොට බැලිය හැක.

10. නැවත නොගෙවන ගාස්තු රු. 15,000.00ක් ගෙවීමෙන් අනතුරුව, අම්පාර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් 2026.02.03 දින සිට 2026.02.24 දින දක්වා 09.00 පැය සිට 15.00 පැය දක්වා කාලයේදී අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සැකසී ඇති ලංසු ලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැක. ගෙවීම් මුදලින් කළ යුතුය.

11. ලංසු 2026.02.25 දින 10.00 පැයට හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයෙහි, දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම්, කාර්යාලය, අම්පාර වෙත ගෙනවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් ලංසු විවෘත කරනු ලැබේ.

12. ලංසු 2026.05.27 දින දක්වා වලංගු විය යුතුය.

13. සියලුම ලංසු සමග රු. 750,000.00 ක ලංසු සුරක්ෂණයක් අමුණා එවිය යුතුය. ලංසු සුරක්ෂණය 2026.06.24 දින දක්වා වලංගු විය යුතුය.

14. පූර්ව ලංසු රැස්වීමක් 2026.02.10 දින 14.00 පැයට අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැවැත්වේ.

**දිස්ත්‍රික් ලේකම්,**
**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර.**
**2026.02.02**